"කොරෝනා චීනයට ආවේ ධූමකේතුවකින් -ලොව පතළ ශ්‍රී ලාංකික අභ්‍යවකාශ ජීව විද්‍යාඥයෙක් හෙළි කරයි" යන සිරස්තලයෙන් යුතුව ඉරිදා මව්බිම පුවත්පතේ පළව ඇති පුවතකි. මෙහිදී මහාචාර්ය චන්ද්‍රා වික්‍රමසිංහ විසින් නවකොරෝනා වෛරසය ධූමකේතුවක් ඔස්සේ පැමිණියා විය හැකි යැයි ඉදිරිපත් කළ මතය සම්බන්ධයෙන් තොරතුරු පළවී තිබේ. මෙය සනාථ කෙරුණු පුවතක් ලෙසින් පෙන්වන සිරස්තලයක් සමගින් ඉරිදා මව්බිම පුවත්පත මෙම "මතය" සම්බන්ධයෙන් පාඨකයාට පවසන නමුත්, පුවත්පත නොපවසන කරුණක්ද තිබේ. එනම්, මෙය විද්‍යාත්මකව සනාථ නොකළ මතයක් පමණක් බවත්, ඊට වෙනත් විද්‍යාඥයින් විසින් අභියෝග කොට ඇති බවත් වේ. මෙම ලිපිය සඳහා ඩේලිමේල් ලිපියක් මූලාශ්‍ර ලෙසින් දක්වා ඇත. නමුත් එම ඩේලිමේල් ලිපිය තුළ මහාචාර්ය චන්ද්‍රාගේ මතය දක්වන අතරම, විද්‍යා ලෝකය විශාල වශයෙන් එම මතය ප්‍රතික්ෂේප කරන බවද දැක්වේ. නමුත් ඉරිදා මව්බිම ලිපිය තුළ එම කරුණද දක්නට නොලැබේ.

මහාචාර්ය චන්ද්‍රා ඉදිරිපත් කරන අදහස Panspermia ලෙසින් හැඳින්වෙන කල්පිතයක් වන අතර, එය නවමු අදහසක් නොවේ. එයින් කියැවෙන්නේ ධූමකේතු වැනි දෑ ඔස්සේ අභ්‍යවකාශය හරහා ග්‍රහලෝක වෙතට ජීවය: එනම් ක්ෂුද්‍ර ජීවීන් සහ රසායනික පූර්වජයන් පැතිර යා හැකි බවයි. නමුත් නවකොරෝනා වෛරසය මෙසේ පෘතුවිය මතට පැමිණි බව මෙතෙක් විද්‍යාත්මකව සනාථ කර නොමැත.
මෙවන් පසුබිමකදී පළ වන, ආකර්ෂණය සඳහා යෙදෙන මෙවන් සිරස්තල මගින් සිදුවන්නේ පාඨකයා නොමග යැමයි. මෙවන් කරුණු සම්බන්ධයෙන් එක් මූලාශ්‍රයකින් නොසෑහී, විශ්වසනීය මූලාශ්‍ර කීපයක් පරිශීලනයෙන් යුතුව කරුණු කාරණා ඇති සැටියෙන් ඉදිරිපත් කිරීම ජනමාධ්‍යයක වගකීමයි. කොවිඩ්-19 සම්බන්ධයෙන් වාර්තා කිරීමේදී සත්‍ය සහ තහවුරු කරන ලද මූලාශ්‍ර පමණක් පරිශීලනය කරන මෙන් සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයෙන් ජනමාධ්‍ය වෙත නිකුත් කළ නිර්දේශ මාලාවේද සඳහන් වන බව මෙහිදී අපි පෙන්වා දෙමු.

මූලාශ්‍ර:
https://www.space.com/amp/coronavirus-not-from-outer-space.html
https://www.express.co.uk/news/science/1257089/Coronavirus-from-space-meteor-panspermia-COVID19-latest-coronavirus-news/amp
https://www.panspermia.org/astronmy.htm
https://www.dailymail.co.uk/sciencetech/article-8104085/amp/Scientist-claimed-coronavirus-came-SPACE-says-prevailing-winds-spreading-disease.html

#MediaEthicsSL #lka #SinhalaPress #News #COVID19 #Coronavirus #SundayMawbima
— with Nalaka Gunawardene and WHO Sri Lanka.